# මධ්‍යම පැළ තවාන් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය

## 1. විධායක සාරාංශය

වනාන්තර විනාශය ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව හායනයට බලපානු ලබන බරපතලම පාරිසරික ගැටලුවකි. 1920 ගණන්වලදී දිවයිනේ 49% ක වනාන්තරයක් තිබුණද 2005 වන විට මෙය දළ වශයෙන් 26% කින් පහත වැටී තිබුණි. 1990 සිට 2000 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට සාමාන්‍යයෙන් වසරකට හෙක්ටයාර් 26,800 ක වනාන්තර අහිමි විය. මෙය සාමාන්‍ය වාර්ෂික වන විනාශය 1.14% කි. 2000 සහ 2005 අතර අනුපාතය වාර්ෂිකව 1.43% දක්වා වේගවත් වී ඇත. වැඩි වන ජනගහනය සහ වනාන්තර ඉඩම් කෘෂිකාර්මික කටයුතු සඳහා එළි කිරීම, නීති විරෝධී ගස් කැපීම්, හේන් වගාවන්, නැවත නැවත සිදු කරන ලද ගිනි තැබීම් ආදිය නිසා ස්වභාවික වනාන්තර විනාශ වී ඇත. එමෙන්ම මූලික වශයෙන් තේ වගාව සඳහා කඳුකර බිම් එළි කිරීම හරහා ඉහළ පාංශු ඛාදන සහ හායන තත්වයන් පවා ඇති වී ඇත. වර්තමානයේදී ඉහළ කඳුකර ප්‍රදේශයේ ජලමූලාශ්‍ර වල ජල පෝෂක ප්‍රදේශ වල පයිනස්, යුකැලිප්ටස් සහ ෆයිනස් වැනි ශාක වලින් ආවරණය වී ඇත. මෙම හේතුව නිසා ජල පෝෂක ප්‍රදේශය සීදී යාමේ තර්ජනයට මුහුණ පා ඇති අතර එමනිසා ජනතාවට දෛනික ජල අවශ්‍යතාවය සඳහා අවශ්‍ය වන ජලය නොලැබී යාම සහ එම ජලපෝෂක ප්‍රදේශයේ ඇති ජෛවවිවිධත්වයට හානිවීම පැමිණීම ආදි පාරිසරික අයහපත් ප්‍රතිඵලයන් රාශියකට මුහුණ පෑමට සිදු වී ඇත. එමෙන්ම ඉහළ කඳුකර ප්‍රදේශය වනාන්තර වලින් තොර වීමත් සමඟම පාංශු ඛාදනය සහ හායනය ඉහළ යාම සිදු වී ඇති අතර ඉහළ කඳුකර ප්‍රදේශ වල පස් අංශූන් පහත් ප්‍රදේශයන්ට ප්‍රවාහනය වීම සහ තැම්පත් වීම නිසා ජලාශ වල රොන්මඩ තැම්පත් වීම වැනි අහිතකර පාරිසරික ගැටළු ඇති වී ඇත. මෙය බලශක්ති ප්‍රභවයක් ලෙස ජලවිදුලි උත්පාදනය සිදු කරනු ලබන අප වැනි රටකට මහත් වූ ගැටළුකාරී තත්වයක් වී ඇත.

එමනිසා මෙම වනාන්තර විනාශය මෙන්ම පාරිසරික ගැටලුකාරී තත්වයන් පැහැදිලිව හඳුනා ගනිමින් දැඩි ලෙස හායනයට ලක් වී ඇති වනාන්තර පුනුරුත්තාපනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම ඉතා වැදගත් වේ.

වනවගාවන් සිදු කිරීම වර්තමානයේදී රාජ්‍ය සහ පෞද්ගලික අංශ හරහා සිදු කිරීම බහුලව දැකිය හැකි වුවද විද්‍යාත්මක වශයෙන් වගා කිරීම සඳහා දේශීය සහ විදේශීය ශාක තෝරාගැනීමේ පටන් දේශගුණික සහ කාලගුණික තත්වයන්ට අනුගත වන පරිදි සුදුසු ශාක තෝරා ගැනීම සඳහා විශේෂ අවධානයක් යෙදිය යුතු වේ. එමෙන්ම මෙම අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස විවිධ අරමුණු සඳහා පවතින ශාක විශේෂ පදනම පුලුල් කර ගැනීම සඳහා නව ශාක විශේෂ හඳුනාගත යුතු වේ. එමෙන්ම උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා උසස් තත්වයේ රෝපණ ද්‍රව්‍ය වල අවශ්‍යතාවයද අත්‍යාවශ්‍ය වේ. උසස් තත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා සහතික ලත් පැල තවාන් හරහා පැල නිෂ්පාදනය සිදු කිරීම අනිවාර්ය වේ. මෙම ගැටළුව හඳුනා ගනිමින් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය තෝරාගත් ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාශයන් ගේ මධ්‍යම පැල තවාන් ඇති කිරීම හරහා ඉහළ ගුණාත්මයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය අරමුණු කොට ගෙන මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට අපේක්ෂා කරයි.

## 2. ව්‍යාපෘතිය සිදු කරන ආයතනයේ ඉතිහාසය සහ ආයතනය පිළිබඳ විස්තරය

1972 අංක 11 දරන කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව 1978 පෙබරවාරි මස 02 වන දින නිකුත් කරන ලද අංක 302/12 දරණ අතිවිශේෂ ගැසට් නියෝගය මගින් ජාතික කෘෂිකර්ම විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය (NADSA) ස්ථාපනය කර ඇත. උක්ත ගැසට් නිවේදනය මගින් පහත කාර්යන් ඉටු කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන ලබා දී ඇත.

1. කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය හා පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමණාකරනය සඳහා සැලසුම් සකස් කිරිම හා ක්‍රියාත්මක කිරිම.
2. සංස්ථාව වෙත සතු කරන ලද ඉඩම් වල උපරිම ඵලදායීතාව, පරිසරය රැකීම ඉඩම් හා ජල සම්පත් සංරක්ෂණය හා ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයන් කළමනාකරණය.
3. කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරිම හා අලෙවිකරණය.
4. කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස සංවර්ධනය සඳහා විවිධ උපකරණ සැපයීම හා නඩත්තු කිරිම.

ජාතික කෘෂිකර්ම විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය (NADSA) ආයතනය බිහිවීම සඳහා හේතු වුයේ 1950 කාලයේ ඇතිවූ දේශපාලන හා සමාජ වෙනස්කම් නිසාත් වෙළඳපලේ තේ මිල සීඝ්‍රයෙන් අඩු වීම නිසාත් තේ වතු විශාල වශයෙන් නඩත්තු නොකර අත්හැරීම නිසාවෙනි. එසේම ඒහි ප්‍රතිඵලයක් ලෙස තේ වතු වල ආර්ථික වැදගත්කම අඩුවන්නට වූ අතර ඉඩම් නඩත්තුව දුර්වල වීම හේතුවෙන් සෝදා පාළුවට වැඩි වී එම ඉඩම් තවදුරටත් නිසරු තත්වයට පත්වීම ආරම්භ වු අතර එයින් පාරිසරික වශයෙන්ද ගැටළු පැන නගින්නට විය. එමෙන්ම මධ්‍යම කඳුකරයේ වැවිලි ආර්ථිකය නිසා පාරම්පරික ඉඩම් අහිමි විශාල පිරිසක් බිහිව තිබීමත් අධික ජනගහනය නිසාම රැකී රක්ෂා ආදායම් මාර්ග අහිමි හා ඉඩකඩම් අහිමිව අසහනයෙන් පෙලෙන ජනතාවක් ජීවත් වීමත් මත සංකීර්ණ ගැටළු ගණනාවක් තේ වතු ආශ්‍රිත මැදරට ප්‍රදේශයේ පැන නැඟෙන්නට විය.

මෙහිදී එම නොසලකා හරින ලද ඉඩම් සඳහා විකල්ප ඉඩම් පරිභෝජන රටාවක් හඳුන්වා දීමට ඇති අවශ්‍යතාවය මෙන්ම ඉඩම් අහිමි ජනතාවට ඉඩමක අයිතිය ලබාදීමටත් තේ වගාවට ඇති ප්‍රමුඛතාවය වෙනුවට බෝග විවිධාංගීකරණය තුළින් යම් විසඳුමක් ලබා දීමත් මධ්‍යම කඳුකරයේ ඇති වෙමින් පැවතුන ජලමුලාශ්‍ර වල සුරක්ෂිත බව පිරිහීමට විසඳුමක් ලෙසත් "NADSA" ව්‍යාපාරය ආරම්භ විය.

1978 වසරේදී අක්කර 26000 ක් පමණ ව්‍යාපාරය වෙත පවරා කටයුතු ආරම්භ කිරීම සිදුකරන ලදී. එයින් අක්කර 15000ක් පමණ වන වගාව සඳහා යොමු කරන ලද අතර ඉතිරි ඉඩම් ප්‍රමාණය ගොවි පවුල් 6000ක් අතරේ බෙදාදෙමින් සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදී. මෙම කටයුතු සඳහා අන්තර් ජාතික සංවර්ධන අරමුදලින් ණය ආධාර ලැබුණද ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය තුල ඇති වූ යම් යම් අඩුපාඩුකම් නිසා එම අරමුදල 1982 දී තම දායකත්වය ඉවත් කර ගන්නා ලදී. ඉන්පසු රාජ්‍ය

භාණ්ඩාගාර අරමුදල් මඟින් නව කළමනාකාරීත්වයක් යටතේ ඉඩම් සංවර්ධන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සිදුවිය.

පසුව එම වැඩසටහන් වල පැවති සාර්ථකත්වය නිසාම 1989දී ලෝක ආහාර සංවිධානයේ අනුග්‍රහය මත පස් අවුරුදු කාලයක් පුරා ලෝක ආහාර සංවිධානයේ ආධාර ඉඩම් හිමි ජනපදිකයින් හට තම ඉඩම සංවර්ධනය කරගැනීම වෙනුවෙන් රුපියල් 2500 ක ආහාර සලාකයක් ලබාදීමට හැකිවිය. එමෙන්ම මහ භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රතිපාදන මත ජනපදවාසීන්ගේ සියළුම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සිදුවිය.ඒ යටතේ නිවාස, මාර්ග සංවර්ධනය, ජල පහසුකම් වැඩිදියුණු කිරීම, වැසිකිළි පහසුකම් වැඩිදියුණු කිරීම සහ ඉඩම් සංවර්ධනයට අවශ්‍ය සියළු පහසුකම් (රෝපණ ද්‍රව්‍ය, පොහොර,කෘෂි උපකරණ, තාක්ෂණික දැනුම) ආදිය ලබා දෙන ලදී. මේ තුලින් 1994 වර්ෂයේ ලෝක ආහාර ව්‍යාපෘතිය අවසන් වන විට ගොවි ගම්මාන බිහිකිරීමේ වගකීම ඉතාම සාර්ථකව ඉටු කිරීමට NADSA ව්‍යාපාරයට හැකි විය.

මෙලෙස ජනතාවගේ ඉඩම් හිමිකම ලබාදීම, සියළුම නිවාස ඇතුළු යටිතල පහුකම් වැඩිදියුණු කිරීම, ඉඩම් සංවර්ධනය සහ ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් ලබාදීම, ආර්ථික සංවර්ධනය සඳහා සත්ව පාලනය සහ මීමැසි පාලනය ආදිය හඳුන්වා දීම, නව තාක්ෂණික දැනුම හුවමාරුව හරහා NADSAව්‍යාපාරය තවදුරටත් සාර්ථක විමට හේතු සාධක විය.

1991 දෙසැම්බර් මස 7 වන දින නිකුත් කරන ලද අංක 678/ 15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින්

මෙලෙස ක්‍රියාත්මක වු නැඩ්සා ආයතනයෙහි නිල නාමය ශ්‍රී ලංකා හරිත දනවි බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය (හදබිම අධිකාරිය) ලෙස සංශෝධනය කරන ලදී. ඒ සමඟ කෑගල්ල හා මහනුවර යන දිස්ත්‍රික්කවලට පමණක් සීමා වූ අධිකාරියේ සංවර්ධන බල ප්‍රදේශ නුවරඑළිය, මාතලේ, රත්නපුර, බදුල්ල, කෑගල්ල සහ මොණරාගලයන දිස්ත්‍රික්ක වලටද ව්‍යාප්තකර ඇත. තවද මෙම සංශෝධනය සමඟ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් සංවර්ධනය වෙනුවට රජයේ විවිධ අණපනත් මගින් ගොවීන්ට ලබා දෙන ඉඩම් සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත. ආරම්භක අවධියේ දී ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර ලැබුණද පසුකාලීනව මෙම ව්‍යාපෘතිය මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වී ඇත. ඒ අනුව 1995 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරය විසින් අධිකාරිය වෙත වෙන් කරනු ලබන වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන මත වාර්ෂික ඉලක්කගත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

අතීතයේ සිටම කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂයපථය යටතේ ක්‍රියාත්මක වු ශ්‍රී ලංකා හදබිම අධිකාරිය 2017 මාර්තු 16 දින නිකුත් කරන ලද 1958/ 7 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්කරන ලදී. මෙම පරිවර්තනය සමඟම අධිකාරියේ ආරම්භක ගැසට් නිවේදනය සංශෝධනයට ලක් කිරීමටත්, කාලීන ලෙස වැදගත් වන නව සංශෝධන ප්‍රවේශයන් හඳුනාගැනීමටත්. දිවයිනේ හඳුනාගත් ප්‍රදේශ වලට පමණක් සීමා වූ අධිකාරියේ සංවර්ධන වැඩසටහන් දීප ව්‍යාප්ත වැඩසටහන් බවට පත් කිරීම සඳහාත් මෙම සංශෝධනය දී අවධානය යොමු විය.

ඒ අනුව 2017 වර්ෂයේ ජුලි මස 7 වන දින නිකුත් කරන ලද 2026/ 45 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ඉහත සංශෝධනයන් සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව පළමු ගැසට් නිවේදනයේ පවතින අනන්‍යතාවය එලෙසම ආරක්ෂා කරමින් නව සංශෝධනයක් සිදු කර ඇත. ඒ අනුව වාණිජ කර්මාන්ත ප්‍රවර්ධනය හා විදේශීය කෘෂිආයෝජකයන් දිරිගැන්වීම, කෘෂිකාර්මික ආයෝජන සඳහා තාක්ෂණය සැපයීම, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා කෘෂිකර්ම ආයෝජකයන් විසින් සිදුකරනු ලබන පශු සම්පත් සංවර්ධනය, බෝග වගාව සඳහා පහසුකම් හා සේවා සැපයීම ආදේශ කොට ඇති අතර අධිකාරියේ සංවර්ධන වැඩසටහන් දීප ව්‍යාප්ත කර ඇත.

වර්තමානයේදී අධිකාරියේ ව්‍යාපෘතින් මහනුවර, මාතලේ, නුවරඑළිය යන දිස්ත්‍රික්කයන් මූලික කොට ගෙන ක්‍රියාත්මක කරයි. අධිකාරියේ ප්‍රමුඛතම සංවර්ධන වැඩසටහන් වන්නේ පාංශු සංරක්ෂණ වැඩසටහන් සහ දිය බෙත්ම කළමනාකරණ වැඩසටහන්, කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන්, භෝග විවිධාංගීකරන වැඩසටහන් සහ අතිරේක ආහාර බෝග ප්‍රචලිත කිරීමේ වැඩසටහන් වේ. මෙම සියලුම වැඩසටහන් සඳහා නව්‍ය තාක්ෂණික දැනුම ගොවීන් වෙත බෙදා හැරීම අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් හරහා සිදු කෙරේ.

## 3. ව්‍යාපෘතියේ අරමුණු:

1. ශාක සනත්වය ඉහළ නැංවීම සඳහා ඉහළ ගුණාත්මයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
2. හඳුනාගත් ප්‍රදේශ සඳහා ශාක විශේෂ පදනම පුළුල් කිරීම සහ වන වගා ක්‍රමවේද සහ ඒවායේ කළමනාකරණය සංවර්ධනය කිරීම.
3. ශාක විශේෂ විවිධත්වය සහ කළමනාකරණ පද්ධති මත අවධානය යොමු කරමින් ඊට අනුරූපීව සංවේදී භූමින් සංරක්ෂණය සිදු කිරීම සහ ජෛවවිවිධත්වය ආරක්ෂා කිරීම.
4. ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය ඉහළ නැංවීම හා භූගත ජල මට්ටම ආරක්ෂා කර ගැනීම.
5. පාංශු ඛාදනය සහ හායනය අවම කර ගනිමින් පාංශු ස්ථායීතාවය පවත්වාගෙන යාම.
6. වස විසෙන් තොර කාබනික ආහාර රටාවක හුරු වීම තුළින් ප්‍රතිලාභීන්ගේ පෝෂණ මට්ටම ඉහළ යාම හා ආහාර සුරක්ෂිතතාවය ඉහළ නංවා ගැනීම.
7. ගෙවතු වගාව හරහා ප්‍රතිලාභීන්ට අතිරේක ආදායම් මාර්ග උත්පාදනය.
8. මාවත් වගාව හරහා පරිසර දූෂණය හා පරිසරයට මුදා හරින කාබන් ප්‍රමාණය (carbon footprint) පාලනය කිරීම.
9. ස්ථිර බෝග හඳුන්වාදීම මගින් තිරසර භූමි පරිභෝජන රටාවට හුරු කරවීම.

## 4. ව්‍යාපෘතියේ ක්‍රමවේදය:

මෙම ව්‍යාපෘතිය හරහා මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්ගේ ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයන් 36ක් ආවරණය කරමින් මධ්‍යම පැළ තවාන් 36 ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන |
|---|---|---|
| 1. | මහනුවර | 20 |
| 2. | මාතලේ | 11 |
| 3. | නුවරඑළිය | 05 |
| | එකතුව | 36 |

ව්‍යාපෘතිය හරහා සිදු කරන පැල නිෂ්පාදනයේදී එක් එක් දිස්ත්‍රික්කයන් සහ ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයන්ට ආවේනික වූ පැල නිෂ්පාදනය සඳහා ද වැඩි අවධානයක් යොමු කරමින් පැල ප්‍රධාන අංශ 5ක් යටතේ පැල නිෂ්පාදනය සිදු කිරීමට අපේක්ෂා කරයි.

1. ගෙවතු වගාවට අවශ්‍ය පැල නිෂ්පාදනය කිරීම
2. ස්ථිර බෝග නිෂ්පාදනය
3. වනවගා පැළ නිෂ්පාදනය
4. මාවත් වගාව සඳහා අවශ්‍ය පැළ නිෂ්පාදනය
5. ඉවුරු වගාව සඳහා අවශ්‍ය පැළ නිෂ්පාදනය

මෙලෙස නිෂ්පාදනය කරනු ලබන පැල වලින් ගෙවතු වගාව සඳහා නිෂ්පාදනය කරනු ලබන පැල තෝරා ගත් ගොවීන් හට ලබා දෙමින් තිරසර ගෙවතු වැඩසටහනක් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන අතර ස්ථිර බෝග වගාව හඳුන්වා දෙමින් තිරසර භූමි උපයෝජනය සඳහා වන තාක්ෂණික දැනුමද ඔවුන් වෙත ලබාදීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම ජලකාමී පැළ සහ වන වගා පැළ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්ගේ වන වගා වැඩසටහන් සහ ජල මූලාශ්‍ර සංරක්ෂණ වැඩසටහන් සඳහා පහසු මිල ගණන් යටතේ නිදහස් කිරීමට සැලැසුම් කර ඇත.

## I. ගෙවතු වගාවට අවශ්‍ය පැල නිෂ්පාදනය

දේශීය ආහාර නිෂ්පාදනය ශක්තිමත් කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා මෑත කාලීනව වඩා වැඩි උනන්දුවක් මහජනයා තුල පවතී. මේ සඳහා පවතින කොරෝනා අවධානම් තත්වය සහ ඒ සමඟ නොයෙකුත් රටවල ආහාර නිෂ්පාදනය සහ ආනයනය පහළ යෑම මේ සඳහා බලපා ඇත. එහි ප්‍රතිපලයක් වශයෙන්, ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩි දියුණු කිරීමේ උපාය මාර්ගයක් ලෙස ගෙවතු වගාව කෙරෙහි වැඩි අවධානයක් වර්තමානයේදී යොමුව ඇත. ගෙවතු යනු දේශීය ආහාර පද්ධතිවල සහ ලොව පුරා සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂිකාර්මික වශයෙන් අනිවාර්ය අංගයක් වන අතර සීමිත සම්පත් සහ පවුලේ ශ්‍රමය උපයෝගී කොට ගනිමින් පවුලේ ආහාර සුරක්ෂිතතාවය ඇති කර ගැනීම සඳහා ඉතාමත් ඵලදායී ක්‍රියාවලියකි.

ගෙවතු වගාවට අවශ්‍ය පැල නිෂ්පාදනය කිරීම යටතේ පවුලේ ආහාර සුරක්ෂිතතාවය සඳහා ඉතා අවශ්‍ය වන පැල කට්ටලයක් නිෂ්පාදනය කර ලබා දීමට අපේක්ෂා කෙරේ. මෙහිදී පහත පැල වර්ග මධ්‍යම පැළ තවාන තුළ නිෂ්පාදනය කර පැළ කට්ටලයක් වශයෙන් තෝරා ගත් පවුල් සඳහා බෙදා දීමට අපේක්ෂා කරයි.

| අනු අංකය | පැල වර්ගය | අනු අංකය | පැල වර්ගය |
|---|---|---|---|
| 1. | බටු | 11 | ලෙමන් |
| 2. | තක්කාලි | 12. | දෙහි |
| 3. | මාළු මිරිස් | 13. | කරපිංචා |
| 4. | කහ | 14. | වට්ටක්කා |
| 5. | ඉඟුරු | 15. | බණ්ඩක්කා |
| 6. | මිරිස් (කොච්චි) | 16. | කරවිල |
| 7. | රාබු | 17. | පතෝල |
| 8. | දඹල | 18. | බෝංචි |
| 9. | නෝකෝල් | 19. | වැටකොළු |
| 10. | පිපිඤ්ඤා | 20. | අමු මිරිස් |

## II. ස්ථිර බෝග පැළ නිෂ්පාදනය

මේ යටතේ එදිනෙදා පරිභෝජනය සඳහා මෙන්ම අතිරේක ආදායම් මාර්ගයක් ලබා ගැනීම සඳහා ස්ථිර බෝග වගාව හඳුන්වා දිය හැක. අතීතයේ පටන් මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කයන් ගේ ගෙවතු උඩරට ගෙවතු හෙවත් “Kandyan Forest garden “ ලෙස සකස් කර තිබීම විශේෂත්වයකි. මෙය ස්වභාවිකව කුඩා වනයක් ආකාරයෙන් සකස් වී තිබීම නිසා නිවසේ පරිබෝජනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නිවසට ලැබීම මෙන්ම ඒ හරහා ජෛවවිවිධත්වය ආරක්ෂා වීමද සිදු විය. නමුත් වර්තමානයේ පවතින අධික ජනගහණ වර්ධන වේගය සහ කෘෂිකර්මාන්තය නිසා සිදුවන ඉඩම් කට්ටි කිරීම් සහ එළිපෙහෙළි කිරීම් නිසා මෙම උඩරට ගෙවතු සීඝ්‍රයෙන් විනාශ වී යාම සිදුවී ඇත. එම නිසා ව්‍යාපෘතිය හරහා ස්ථිර බෝග වගාව ඉහළ නංවමින් උඩරට ගෙවතු සංකල්පය නැවත ඇති කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර ඇත. එහිදී තමාගේ වගා භූමිය උපරිම අයුරින් කළමනාකරණය සිදුකරගනිමින් ස්ථිර බෝග වගා කිරීම පිළිබඳ තාක්ෂණය ප්‍රතිලාභීන් හට ලබාදීමට ව්‍යාපෘතිය හරහා අපේක්ෂා කරයි. මේ සඳහා පහත පැල කට්ටලයන් මධ්‍යම පැළ තවාන තුල නිෂ්පාදනය කර බෙදා හැරීමට අපේක්ෂා කරයි.

| අනු අංකය | පැල වර්ගය | අනු අංකය | පැල වර්ගය |
|---|---|---|---|
| 1. | බද්ධ අඹ | 11. | වෙරළු |
| 2. | පොල් | 12. | කාමරංගා |
| 3. | තැඹිලි | 13. | බද්ධ අඹරැල්ලා |
| 4. | බද්ධ රඹුටන් | 14. | මිටි මුරුංගා |
| 5. | බද්ධ කොස් | 15. | ජම්බෝල |
| 6. | ජමනාරං | 16. | නෙල්ලි |
| 7. | නාරං | 17. | බෙලි |
| 8. | අලිපේර | 18. | දිවුල් |
| 9. | කෙසෙල් | 19. | කිලෝ පේර |
| 10. | දෙළුම් | 20. | කටු අනෝදා |

## III. වනවගා පැල නිෂ්පාදනය

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකර කලාපයෙන් රටේ ප්‍රධාන ගංගා බොහොමයක් ආරම්භ වන අතර වන විනාශය සහ කෘෂිකාර්මික ව්‍යාප්තිය හේතුවෙන් මෙම කලාපය පාංශු ඛාදනයට සහ ජෛවවිවිධත්ව හායනයට විශාල වශයෙන් ගොදුරු වෙමින් පවතී. එමෙන්ම මධ්‍යම කඳුකරයේ ඉහළ ප්‍රදේශයන් වාණිජ මෙන්ම ජෛවවිද්‍යාත්මක වශයෙන්ම ද කිසිදු වටිනාකමක් නොදක්වන පයිනස්, යුකැලිප්ටස් සහ ටර්පන්ටයින් යන ශාක වලින් බහුල වීම නිසා දැනටමත් එම ප්‍රදේශයන් කාන්තාර ලක්ෂණ පෙන්නුම්කරන අතර ජල මූලාශ්‍ර සිඳී යාමේ බලපතල ගැටළුවකට මුහුණ පා ඇත. එම නිසා එම ශාක ගහණයන් ක්‍රමක්‍රමයෙන් ඉවත් කර ශ්‍රී ලංකාවට ආවේනික වන වගා පැල වලින් ප්‍රතිස්ථාපනය කිරීම හරහා මෙම ගැටළු සඳහා පිලියම් ලැබෙනු ඇත. එබැවින් මෙම ව්‍යාපෘතිය හරහා වන වගා පැළ නිෂ්පාදනය සඳහා අවධානය යොමු කර ඇති අතර මධ්‍යම පැළ තවාන් තුල වන වගා පැළ නිෂ්පාදනය සිදු කර අවශ්‍යතාවය පරිදි නැවත වන වගාව සඳහා යොමු කිරීම සහ ජල මූලාශ්‍ර සංරක්ෂණය සඳහා බෙදා හැරීමට අපේක්ෂා කරයි.

ව්‍යාපෘතිය හරහා පහත වන වගා පැළ නිෂ්පාදනය සඳහා අවධානය යොමු කර ඇත.

| අනු අංකය | පැල වර්ගය | අනු අංකය | පැල වර්ගය |
|---|---|---|---|
| 1. | මී | 14. | නැදුන් |
| 2. | කැකුණ | 15. | බුරුත |
| 3. | කරඳ | 16. | සුදු හඳුන් |
| 4. | කීන | 17. | කළුමැදිරිය |
| 5. | මොර | 18. | කටකැල |
| 6. | කුඹුක් | 19. | නික |
| 7. | කළුවර | 20. | අත්තික්කා |
| 8. | හල්මිල්ල | 21. | ගොරකා |
| 9. | හොර | 22. | හොඩ බෙරලිය |
| 10. | ගොඩපර | 23. | පලු |
| 11. | නා | 24. | දිවුල් |
| 12. | කිතුල් | 25. | සියඹලා |
| 13. | බුළු | 26. | වේවැල් |

## IV. මාවත් වගාව සඳහා අවශ්‍ය පැළ නිෂ්පාදනය

වර්තමානයේදී ජනගහණය ඉහළ යාමත් සමඟම යටිතල පහසුකම් දියුණු වීම කාලානුරූපීව සිදුවන ක්‍රියාවලියකි. අධිවේගී මාර්ගයන් සහ අනෙකුත් මං මාවත් සංවර්ධනය කිරීමේදී බොහෝ පාරිසරික විනාශයන් සිදුවීම ද නිරන්තරයෙන් සිදු වේ. මාවත් වගාව අත්‍යවශ්‍ය වන්නේ ඒ ආශ්‍රිතව සිදු වන ඉවුරු ඛාදනය වැලැක්වීම, වාහන වලින් පිටවන දුම් , ශබ්දය සහ දූවිලි ආදිය නිසා සිදුවන පරිසර දූෂණය පාලනය කිරීම සඳහාය. එමෙන්ම මෙම මාවත් වගාව නිසා ගංවතුර තත්වයන් පාලනය වීම සහ ශාක සුලං බාධක ලෙස ක්‍රියා කිරීම නිසා ස්වාභාවික විපත් වලින් ආරක්ෂාව ලැබීමද නිරන්තරයෙන් සිදු වේ.



මාවත් වගාවන් නිසි ලෙස අනුගමනය නොකරන ලද මාර්ගයක්



මාවත් වගාවන් නිසි ලෙස සිදු කරන ලද මාර්ගයක්

මාවත් වගාව සඳහා අවශ්‍ය වන පහත පැල වර්ග පැල තවාන් හරහා නිෂ්පාදනය කිරීම සඳහා අපේක්ෂා කෙරේ.

| අනු අංකය | පැල වර්ගය | අනු අංකය | පැල වර්ගය |
|---|---|---|---|
| 1. | පිහිඹියා | 6. | නුග |
| 2. | කොට්ටම්බා | 7. | කොහොඹ |
| 3. | ඇහැළ | 8. | මැයි මාර |
| 4. | රොබරෝසියා | 9. | අශෝක |
| 5. | නා | 10 | වැටකෙයියා |

## V. ඉවුරු වගාව සඳහා පැළ නිෂ්පාදනය

කෘෂිකාර්මික කටයුතු වලදී ජලය මූලික සම්පතක් වන අතර කෘෂිකාර්මික කටයුතු සඳහා ජල මූලාශ්‍ර සංරක්ෂණය ඉතා වැදගත් වේ. ඒමෙන්ම මත්ස්‍යය කර්මාන්තය මෙන්ම ජලජ ජීවීන් ජල මූලාශ්‍ර මත යැපෙන අතර ඒය ජාතියේ ආහාර සුරක්ෂිතතාවයට වැදගත් වේ. එමනිසා පවතින ජල මූලාශ්‍රයන් ආරක්ෂා කර ගැනීම ඉතා වැදගත් වේ.

වර්තමානයේදී ස්වාභාවික පරිසර පද්ධතියේ ඵලදායීතාවය සඳහා දැඩි කෘෂිකාර්මික ක්‍රියාකාරකම් බලපායි. ඒනම් ගංගා හා ඇළ දොළවලට පළිබෝධනාශක හා පොහොර වැනි දූෂක ද්‍රව්‍ය ඒකතුවීම, පාංශු ඛාදනය නිසා සෝදා යාමෙන් ඒක් රැස්වන පාංශු අංශු තැම්පත් වීම හරහා ගංගා ඇළදොළ වල පවතින ජලධාරිතාවය පහළ යෑම, ජලජ ශාක ගහණය ඉහළ යෑම නිසා ජලජ ජීවීන් හට අවශ්‍ය වන ඔක්සිජන් ප්‍රමානය පහළ යෑමේන් ඔවුන් මරණයට පත්වීම මෙන්ම සුපෝෂණය වැනි පාරිසරික ගැටළු තත්වයන් ඇතිවීම සිදු වේ. මෙම ජල සම්පත ආරක්ෂා කිරීම සහ පාංශු සම්පත ආරක්ෂා කිරීම සඳහා ඉවුරු වගාව ඉතාම ඉවහල් වේ.

| අනු අංකය | පැල වර්ගය | අනු අංකය | පැල වර්ගය |
|---|---|---|---|
| 1. | පුවක් | 11. | බක්මී |
| 2. | වැටකෙයියා | 12. | රට දෙල් |
| 3. | කුඹුක් | 13. | දිය පර |
| 4. | මී | 14. | ගොඩපර |
| 5. | දිවි කඳුරු | 15. | රත් ගොරකා |
| 6. | දිය කඳුරු | 16. | ගොරකා |
| 7. | දවුල් කුරුඳු | 17. | ගොඩ කඳුරු |
| 8. | මැල්ල | 18. | ඇටඹ |
| 9. | අං කෙන්ද | 19. | කජු |
| 10. | අරිද්ද | 20. | බදුල්ල |

ව්‍යාපෘතිය හරහා එක් ප්‍රා.ලේ කොට්ඨාශයකින් තවාන පාලනය සඳහා එක් ව්‍යවසායකයකු බැගින් ව්‍යවසායකයින් 36 දෙනෙකු බිහි කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී අවම සේවක ප්‍රමාණයකින් පැල තවාන පවත්වා ගනිමින් අපේක්ෂිත පැල ප්‍රමාණය නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

## 5. ව්‍යාපෘතියේ ඉලක්ක ගත ප්‍රතිලාභීන්:

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් 36 න් එක් ව්‍යවසායකයකු බැගින් බිහි කිරීමට අපේක්ෂා කරන අතර පැල තවාන් රැකියා නිර්මාණය වීම සිදු වේ.

## 6. ව්‍යාපෘතියේ ක්‍රියාත්මක සැලැස්ම:

ඇමුණුම 01 මගින් දක්වා ඇත

## 7.ව්‍යාපෘතියේ කාල රාමුව:

| | ක්‍රියාකාරකම | කාලය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජන. | පෙබ | මාර්තු | අප්‍රේ | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
| 01 | තවාන ඉදිකිරීම සඳහා භූමිය වෙන් කරවා ගැනීම | | | | | | | | | | | | |
| 02 | න්‍යායාත්මක පුහුණු පැවැත්වීම | | | | | | | | | | | | |
| 03 | ප්‍රායෝගික පුහුණු පැවැත්වීම | | | | | | | | | | | | |
| 04 | පැල තවාන සකස් කිරීම සඳහා අවශ්‍ය උපකරණ කට්ටලයක් ලබා දීම | | | | | | | | | | | | |
| 06 | පැළ නිෂ්පාදනය | | | | | | | | | | | | |
| 07 | ව්‍යාපෘතියේ අධීක්ෂණය සහ මෙහෙයුම් කටයුතු සිදු කිරීම | | | | | | | | | | | | |

## 8. අපේක්ෂිත නිමැවුම හා ප්‍රතිඵල:

| නිමැවුම | ප්‍රතිඵල |
|---|---|
| 2021 වර්ෂය අවසාන වන විට මධ්‍යම පැළ තවාන් 36 ඇති කිරීම | 2021 වර්ෂය අවසානයේදී විවිධ පැල වර්ග 555200 ප්‍රමාණයක් මධ්‍යම පැළ තවාන් හරහා නිෂ්පාදනය කිරීම |

## 9. අවධානම සහ අඩමානය:

අයහපත් කාලගුණික තත්වයන් නිසා අපේක්ෂිත තරම් පැළ නිෂ්පාදනයක් කරා යෑමේ බාධා ඇතිවිය හැක.

## 10 . ව්‍යාපෘතියේ යාවත්කාලීන පිරිවැය

ඇමුණුම 02 මගින් දක්වා ඇත

## 11. ව්‍යාපෘති ඇගයීම

ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් ගේ සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිර්දේශය මත සිදුවන අතර පෙර ඇගයීම් කටයුතු අධිකාරියේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සිදු කරයි. ව්‍යාපෘතියේ සමස්ථ ඇගයීම් කටයුතු පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය, ගෘහස්ත සත්ව පාලනය, සුළු ආර්ථික බෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හරහා සිදු කෙරේ.

## 12.ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම

මෙම ව්‍යාපෘතිය හරහා රටේ වන ගහණය ඉහළ යාම , ජල මූලාශ්‍ර ආරක්ෂා වීමෙන් භූගත ජල මට්ටම ඉහළ යාම , ජෛවවිවිධත්වය ආරක්ෂා වීම සහ සමස්ථ පරිසර දූෂණය පහළ යාම සිදු වේ.

## 13.ස්ත්‍රී පුරුෂ සමාජභාවය

ව්‍යාපෘතිය හරහා කාන්තාවන් මෙම පැළ තවාන් සඳහා ව්‍යවසායකයින් ලෙස පුහුණු කිරීම හරහා අතිරේක ආදායම් මාර්ග උත්පාදනය කරමින් ආර්ථික ශක්තිමත් කිරිමට අපේක්ෂා කෙරේ.

## 14.ව්‍යාපෘතියේ තිරසාර බව

මෙම ව්‍යාපෘතිය නියමු ව්‍යාපෘතියක් ලෙස මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රිකයන් ගේ සියලුම ප්‍රා. ලේ කොට්ඨාශයන් ගේ ක්‍රියාත්මක කර අනෙකුත් දිස්ත්‍රික්කයන් වල ප්‍රා.ලේ කොට්ඨාශයන් වෙත ව්‍යාප්ත කිරීම සිදු කිරීම හරහා ව්‍යාපෘති තිරසාර ව්‍යාපෘතියක් ලෙස තවදුරටත් පවත්වා ගත හැක.